ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයෙන් පළ කරනු ලබන මාගධී සඟරාවේ මෙවර කලාපය මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් සැමිරීම පිණිස කැප කොට තිබීම අතිශයින් ම ප්‍රශංසා කටයුතු කෘතවේදී කර්තව්‍යයක් හැටියට හැඳින්විය හැකි ය. මෙම මාගධී කලාපය සැබැවින් ම මහ නාහිමියන්ගේ භාෂා නෛපුණ්‍යය, දර්ශන ශාස්ත්‍ර විශාරදත්වය හා ගුණ ගරුක භාවය යන කරුණු වලට උපහාරයක් ම වන ශාස්ත්‍රීය ලිපි ලේඛන සමූහයකින් සමුපලක්ෂිත ය. සිංහල, පාලි, සංස්කෘත සහ ඉංග්‍රීසි යන භාෂා චතුෂ්කයෙන් ලියැවුණු ආධුනික සහ ප්‍රවීණ යන දෙපාර්ශවයට ම සප්‍රයෝජනවත් වන සාරගර්භ ලිපි රාශියක් මෙවර මාගධී කලාපයෙන් දක්නට ලැබෙන බව අවංක ව ප්‍රකාශ කළ යුතු ය. සඟරාව වනාහි දැනුම ප්‍රචාරණය කරන අතිප්‍රබල මාධ්‍යයකි. ලෝකයේ විවිධ ආයතනවල, විශ්වවිද්‍යාලවල සහ පර්යේෂණ ශාස්ත්‍ර ශාලාවල සඟරාවක් පළ කිරීමට නිතර යත්න දරන්නේ මේ හේතුව නිසා ය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයෙහි කේන්ද්‍රස්ථානයක් බවට පැමිණ තිබීම රහසක් නො වේ. මෙවර මාගධී කලාපය එම පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේත් විදග්ධතාව නිරූපණය කරන ශාස්ත්‍රීය කැඩපතක් බඳු යැයි ප්‍රකාශ කරමි.

**ආචාර්ය ඔලිවර් අබේනායක**

**සම්මානිත මහාචාර්ය, සාහිත්‍ය චක්‍රවර්ති**

රු. 300

මාගධී MĀGADHĪ

# මාගධී

# MĀGADHĪ

මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි
අනුස්මරණ කලාපය



සංස්කරණය

හසන්ත වාසනා සමරසිංහ

අමාලි සෙව්වන්දි බණ්ඩාරනායක

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# මාගධී

## ශාස්ත්‍රීය සඞ්ග්‍රහය

මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි
අනුස්මරණ කලාපය

Scanned with CamScanner

CamScanner

# මාගධී

## ශාස්ත්‍රීය සඞ්ග්‍රහය

මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි
අනුස්මරණ කලාපය

**උපදේශක සංස්කාරක**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දුනේෂ් ඉන්ද්‍රරත්න ගුණතිලක

**සංස්කරණය**

හසන්ත වාසනා සමරසිංහ
අමාලි සෙව්වන්දි බණ්ඩාරනායක

CS Scanned with CamScanner

CamScanner

මෙහි අන්තර්ගත ලිපිවල අයිතිය ඒ ඒ ලේඛකයන් සතු වන අතර, ඒ කිසිවක සංස්කාරක මණ්ඩලයේ අදහස් පිළිබිඹු නො කරන බව සැලකුව මනා ය.


මාගධී ශාස්ත්‍රීය සඞ්ග්‍රහය

**මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමි අනුස්මරණ කලාපය**



© හසන්ත වාසනා සමරසිංහ
අමාලි සෙව්වන්දි බණ්ඩාරනායක



පළමු මුද්‍රණය : 2014

ISSN :

පරිගණක අක්ෂර සංයෝජනය : හසන්ත වාසනා සමරසිංහ
අමාලි සෙව්වන්දි බණ්ඩාරනායක

පරිගණක පිටු සැකසුම : විජේවර්ධන ක්‍රියේෂන්ස්

නාහිමි සිතුවම : කේ. වී. නුවන් බුද්ධික පෙරේරා

කඤ්චුක නිර්මාණය : හතරබාගේ සුගතවංශ හිමි

මුද්‍රණය :


ප්‍රකාශනය :


# පණාමපූජා

සද්ධාධනං සුපරිසුද්ධසුවිණ්ණසීලං
පඤ්ඤාකිරීටධරපුඤ්ඤනිධානකප්පං
තෙජාභිරාමසිසිරාකරසන්නිභන්තං
ආනන්දමෙත්තයතිරාජවරං නමාම

විජ්ජොදයාබාහුවිවිස්සුතසත්ථසාලා
නාවාය නාවිකධුරෙනභිපූජිතස්ස
තස්සාභිචාරුගුණබුද්ධිමනුස්සරන්තා
සා "මාගධී" කුසුමපුඤ්ජමිධප්පයාම

විරචිතමිදං සිරිජයවද්ධනපුර විස්සවිජ්ජාලයෙ
ජෙට්ඨකථිකාචරියෙන දස්සනවිසාරදෙන
මැදගොඩගාමජෙන අභයතිස්සෙන යතිනා



CamScanner

## උපකුලපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය මගින් ප්‍රකාශයට පත් කෙරෙන මාගධී වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය වෙනුවෙන් සුභපැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මාගේ භාග්‍යයක් ලෙස සලකමි.

බෞද්ධ අනන්‍යතාවකින් යුත් කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මෙහෙයවීමෙන් ආගමික, සමාජීය හා ශාස්ත්‍රීය කටයුතු වැඩි දියුණු කිරිමෙහි ලා විශාල මෙහෙයක් ඉටු කරයි.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියන් සහ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ අප්‍රතිහත ධෛර්යය මත ගොඩනැගුණු අප විශ්වවිද්‍යාලයේ දියුණුව පිණිස අතීතයේ සිටම භික්ෂූන්ගෙන් සිදුවූයේ අමිල මෙහෙවරකි.

1963 වසරේ එනම් මෙයට පනස් එක් වසරකට පෙර නව ශාස්ත්‍රීය සංග්‍රහයක් ලෙස සාරගර්භ ලිපි සංඛ්‍යාවකින් යුක්තව ප්‍රකාශයට පත්වුණු මෙම සඟරාවේ මුල්ම ශාස්ත්‍රීය ලිපිය අග්ගමහාපණ්ඩිත, මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහාස්ථවිරයන් අතින් ලියැවී ඇත. තවද, එම ප්‍රකාශනයෙහි සෝදුපත් බැලීමට ද එතුමා සහභාගී වී ඇත. සේවාර්ජිත උපකුලපතිවරයෙකු හා බුද්ධ ධර්මය පීඨයේ පීඨාධිපති හා මහායාන බෞද්ධ ධර්මාංශයෙහි ප්‍රමුඛාචාර්ය වූ, අග්ගමහාපණ්ඩිත, මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා නා හිමිපාණන් වහන්සේ කෙරෙහි උපහාර කලාපයක් වශයෙන් පනස් වසරක් සම්පූර්ණ කළ මාගධී 2014 ශාස්ත්‍රීය සංග්‍රහය පළ කිරීමට කටයුතු කිරීම කෘතගුණ දැක්වීමක් මෙන්ම එතුමාගෙන් බෞද්ධාගමට මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ද සිදු වූ අමරණීය සේවය අගය කිරීමක් ද වේ.





Scanned with CamScanner
CamScanner

තවද, මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය එළි දැක්වීම උදෙසා කැප වී කටයුතු කරන පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශාධිපති ස්වාමීන් වහන්සේටත්, මාගධී ශාස්ත්‍රීය සංග්‍රහයේ සංස්කාරකවරුන්හටත්, මාගධී ශාස්ත්‍රීය සංග්‍රය උදෙසා විශිෂ්ට ගණයේ ලිපි සැපයූ සියලුම මහාචාර්ය, ආචාර්ය, විද්‍යාර්ථීන් ඇතුළු සියලුම දෙනාටත් මාගේ ප්‍රණාමය පුද කර සිටීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

අවසාන වශයෙන් මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය නම් මෙම විශිෂ්ට ගණයේ ලිපි එකතුව වඩ වඩා දියුණු වෙමින් අඛණ්ඩවම පැවතීමට මාගේ සුභාසිංසන එක් කරමි.

**ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න,**
උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.



## පීඨාධිපති තුමාගේ ආශිංසනා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාරම්භයේ සිට ම අවිච්ඡින්න ව පළ කෙරුණු අනර්ඝ ලිපි සරණියක් ලෙස "මාගධී" ශාස්ත්‍රීය සංග්‍රහය හැඳින්වීම නිවරද යැයි සිතේ. මේ තුළින් තදිය විද්‍යාර්ථීන්ට සිදු වූ සේවාව අපමණ ය. අප විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය මගින් වාර්ෂික ව එළි දක්වන මෙම ලේඛන සමුච්චයට දිවයිනේ සුප්‍රකට වියතුන් කිප දෙනෙකුගේ ශාස්ත්‍රීය පර්යේෂණ මෙන් ම ආධුනික ලේඛකයන් කිප දෙනෙකුගේ ද අගනා ලිපි රාශියක් අන්තර්ගත කොට තිබීම විශේෂත්වයක් සේ පෙනේ.

"මාගධී" යනු බුදුහිමියන් ශ්‍රී මුඛ දේශනාව සඳහා උපයෝගී කොට ගත් මගධයේ උපන් මූල භාෂාව යි. පාලිය යනු මාගධී භාෂාව ලියා තැබීමට මෙන් ම භාෂණය සඳහා යොදගත් පාඨ යි. පාඨ යන්නෙන් නිපන් පාලි යන්න භාෂාව නොව මාගධී භාෂාවෙහි පාඨ යන්නෙහි වාච්‍යාර්ථය යි. එබැවින් භාෂාව නම් මාගධිය යි.

මෙවර කලාපයෙහි තවත් විශේෂත්‍වයක් නම් මෑත යුගයෙහි ලෝක සම්බුද්ධ ශාසනය පොබ කළා වූ සංඝ රාජයාණන් වහන්සේ නමක වූ අපවත් වී වදළ මහාරට්ඨගුරු, අභිධජ, අග්ගමහා පණ්ඩිත, මහාචාර්ය, පරමපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක මහා ස්වාමීන්‍ද්‍රයන් වහන්සේ වෙනුවෙන් උවසර පිණිස එය වෙන් කොට තිබීම යි. ශාසනාම්බරයෙහි පූර්ණ චන්‍ද්‍රයා සේ වැඩ වසමින් අද්විතීය අමරණීය ධර්ම-ශාස්ත්‍රීය සේවාවක නියැලුණ අප මහනාහිමියෝ ශ්‍රී ජයවර්ධනපුර සරසවියෙහි විටෙක මහාචාර්යවරයෙකු වශයෙන් හා උපකුලපති (විද්‍යෝදය මණ්ඩපාධිපති) වශයෙන් ද පරමාදර්ශී සේවාවක නියුතු වූහ. ඒ උදෙසා කෘතගුණ දැක්වීම් වස් මෙවන් ධර්ම-ශාස්ත්‍රීය



Scanned with CamScanner
CamScanner

පර්යේෂණ ලේඛන එකතුවක් උන්වහන්සේ වෙනුවෙන් උපහාර පිණිස වෙන් කොට තබන්නට කටයුතු කරන සකසුරු මඬුල්ලට අපගේ නොවක් භක්ත්‍යාදර ආශිර්වාදය හෘදයංගම වැ පිරිනමනු කැමැත්තෙමි.

**ලසන්ත නවරත්න,**
**පීඨාධිපති,**
**මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**



## අධ්‍යයනාංශ ප්‍රධාන ස්වාමින් වහන්සේගේ පණිවිඩය

මාගධී යනු ආදි මිනිසුන් භාවිත කර තිබෙන මුල්ම භාෂාව බව ථේරවාද සාම්ප්‍රදායයේ මතයයි. බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනාකර තිබෙන්නේ ද එම භාෂා මාධ්‍යයෙනි. එහි සත්‍යාසත්‍යතාව කෙසේ වුවත් මාගධී නාමයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව උක්ත කියමනෙන් පැහැදිලිය. මාගධී භාෂාවෙන් හෙවත් මාධ්‍යයෙන් බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කළ නිසාවෙන් පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ සංස්කෘතිය යනාදි වශයෙන් විෂයයන් ගණනාවක් වර්තමානය වනවිට නිර්මාණය වී තිබේ. එබැවින් ශාස්ත්‍රීය සඟරාවේ නාමය ඓතිහාසික වශයෙනුත් ශාස්ත්‍රීය වශයෙනුත් වටිනාකමක් තිබෙන බව පෙනේ. එවැනි සම්භාවනීය නාමයකින් මෙම සඟරාව නම්කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය මගින් ඉතා දීර්ඝ කාලයක සිට මාගධී ශාස්ත්‍රීය සඟරාව එළිදක්වයි. එබැවින් මෑත අතීතය තුළ මාගධී සඟරාවට ද ඉතිහාසයක් මෙන්ම වටිනාකමක් ද ලැබී තිබේ. යම් යම් අපහසුතාවන් නිසා පසුගිය වසර තුනක් "මාගධී" එළි දැක්වීමට නො හැකි වුවත් මෙම වසරේ එය යළි මල්ඵල ගැනීම සම්බන්ධයෙන් එහි සංස්කාරක මණ්ඩලයට මාගේ ප්‍රසාදය පළකිරීමට කැමැත්තෙමි.

මෙහි ඇතුළත් බොහෝ ලිපි පාලි හා බෞද්ධ අධ්‍යයන විෂයයන් ඉගනගන්නා ශිෂ්‍යයන්ට අදාළ වූ ඒවා වෙයි. එබැවින් ශාස්ත්‍රීය ලිපි සපයා තිබෙන සියලු ලේඛකයන්ට මාගේ ප්‍රණාමය පිරිනැමීමට කැමැත්තෙමි. ශාස්ත්‍රීය ලිපි එකතුවක් ලෙස නිර්මාණය වන මාගධී සඟරාව සම්බන්ධයෙන් මාගේ හදපිරි සුභාසිංසනය පිරිනමන අතර මින් ඉදිරියටත් වසරක් පාසා මෙම ශාස්ත්‍රීය



Scanned with CamScanner
CamScanner

සංග්‍රහය එළිදැක්වීමෙන් විද්‍යාර්ථීන්ගේ ඥානාලෝකය පහන් කිරීමට සමත් පහන් ටැඹක් බවට "මාගධී" පත්වේවායි ප්‍රාර්ථනා කරමි.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
අධ්‍යයනාංශ ප්‍රධාන,
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.



# පෙරවදන

මේ වන විට මාගධී ශාස්ත්‍රීය සඞ්ග්‍රහය ආරම්භ වී වසර පණහක් ගත වී ඇත. මේ ගෙවෙනුයේ පණස් එක් වන වර්ෂය යි. මීට වසර පහකට පෙර අවසන් වරට මාගධී සඞ්ග්‍රහය පළ කෙරුණේ විදුදය ස්වර්ණ ජයන්තිය නිමිත්තෙනි. ශාස්ත්‍රීය සඞ්ග්‍රහයක් සකස් කොට පළ කිරීමේ දී මුහුණ දෙන ආර්ථික ගැටලු ආදිය ජය ගනිමින් කෙසේ හෝ මෙවර කලාපය පළ කිරීමට දැඩි ව ගත් අදිටනෙහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රන්ථය මේ තරම් හොඳින් පළ කර ගත හැකි විය. මෙවර මාගධිය අතිපූජ්‍ය මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමියන් කෙරෙහි උපහාරයක් වශයෙන් පළ කිරීමට තිරණය කළෙමු. එයට හේතු කිහිපයකි. එහි අනුපිළිවෙළ කථාව මුල පටන් මෙසේ කෙටියෙන් දක්වමු.

අතිපූජ්‍ය හික්කඩුවේ සිරි සුමඞ්ගල ස්වාමිපාදයන් වහන්සේ 1873 වසරේ දී උන්වහන්සේ විසින් ම පිහිටුවන ලද විද්‍යාධාර සභාවේ ද උපකාරය ඇති ව කොළඹ මරදාන මාළිගාකන්ද ප්‍රදේශයෙහි විද්‍යෝදය පිරිවෙණ ආරම්භ කළහ. විශේෂයෙන් හේවාවිතාරණ පවුලේ ද නො මඳ අනුග්‍රහය ඇති ව සංවර්ධනය වූ මෙම පිරිවෙණ ඉතා කෙටි කලකින් මුළු මහත් ලෝකයට ම දැනුම බෙදා හරින කීර්තිමත් විද්‍යාස්ථානයක් බවට පත් විය. විශේෂයෙන් පාලි, සංස්කෘත, සිංහල, බුද්ධ ධර්මය හා ආයුර්වේදය වැනි විෂයයන් ආශ්‍රිත පෙරදිග ඥානය පිළිබඳ මහා දැනුම් කෝෂ්ඨාගාරය විද්‍යෝදය පිරිවෙණ ම විය. විදුදය පරිවේණාධිපති නාමාවලියේ ස්වර්ණමය යුගය වූයේ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමි යුගය යි. එතුමෝ 1959 දී එතෙක් පිරිවෙණක් ලෙස පැවැති මරදානේ විද්‍යෝදය පිරිවෙණ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් බවට පත් කළහ. එහෙත් ටික කලක් ගත වන විට මරදාන පිරිවෙණ බිමෙහි



Scanned with CamScanner
CamScanner

ඉඩ කඩ විශ්වවිද්‍යාලයට ප්‍රමාණවත් නො වූයෙන් එය ගංගොඩවිල රැගෙන එන ලදි. විද්‍යෝදය මහ පිරිවෙණ එදා සිට අද දක්වා ම මරදාන මාළිගාකන්දෙහි ම ඉතිරි විය.

භාෂා පීඨය ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි ආරම්භක පීඨ පහෙන් එකකි. පාලි භාෂා අංශය එහි එක් අධ්‍යයන අංශයක් විය. මේ වන විට භාෂා පීඨයේ පීඨාධිපති ධුරය, පාලි අධ්‍යයනාංශයේ ප්‍රමුඛාචාර්ය ධුරය දැරුවෝ විද්‍යෝදය පරිවේණාධිපති වූ කළුකොඳයාවේ පඤ්ඤාසේඛර නාහිමියෝ ය.

එවකට පාලි අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරය දැරූ කේ. ජිනදාස පෙරේරා මහතාගේ මෙහෙයවීමෙන් මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය ආරම්භ විය. ඒ අනුව බුද්ධ වර්ෂයෙන් 2506 දී හෙවත් රාජ්‍ය වර්ෂ 1963 දී සපුගස්යායේ ධම්මරතන හිමියන්ගේ හා ඊ. ඇම්. බී. කුමාරසිංහ යන අයගේ සංස්කරණයෙන් මාගධී මංගල කලාපය නිකුත් විය. මෙහි ශිෂ්‍යයන්ගෙන් ලිපි ක් ද ගුරුවරුන් හා වෙනත් විද්වතුන්ගේ ලිපි ක් ද ඇතුළත් විය.

එවකට බුද්ධ ධර්මය පීඨයේ මහායාන ධර්මාංශයෙහි ප්‍රමුඛාචාර්ය ධුරය දැරූ මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමියන්ගේ නො මඳ දායකත්වය අප මාගධියට හිමි විය. ඒ ශාස්ත්‍රීය ලේඛනාවලි ආරම්භයට පාලි මාධ්‍යයෙන් ලිපියක් එක් කරමින් සහ කෘතියෙහි සෝදුපත් පරීක්ෂා කිරීමෙනි. එබැවින් එතුමන්ගේ එම ශාස්ත්‍රීය දායකත්වය සිහි කිරීමෙහි උත්සුක වූ අප විසින් මෙවර කලාපය උන්වහන්සේ වෙනුවෙන් අනුස්මරණ කලාපයක් බවට පත් කළෙමු.

මෙවර අප ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා දායකත්වය ලබා දුන්නෝ බොහෝ ය. ඒ අතර අප සරසවියේ උපකුලපති ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න මහතා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති ලසන්ත නවරත්න මහතා, අප අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමිපාණන් ගෞරව



පුරස්සර ව සිහිපත් කර සිටිමු. තවද අප අධ්‍යයනාංශයේ මහාචාර්ය නායිම්බල ධම්මදස්සී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුඹුකේ චන්දාලෝක යන හිමිවරුන් ද, මහාචාර්ය ඥානදාස පෙරේරා, කේ. ඒ. වීරසේන, යාපාරත්න විරසේකර, අරුණ ශාන්ත වල්පොල, නිමල් වසන්ත මෙන්ඩිස්, ගාමිණී රත්නශ්‍රී යන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඇඳුරු මහතුන්ගෙන් ලද උපකාර ද සිහි කර සිටිමු.

සඟරාව සඳහා අවශ්‍ය ලිපි සපයා ගැනීමේ දී උපකාරී වූ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මාවතගම පේමානන්ද හිමිපාණන් හා අප විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මැදගොඩ අභයතිස්ස, කථිකාචාර්ය කුඩාතන්නෝරුවේ විනීත යන හිමිවරුන් ද කෘතඥතා පෙරටු ව සිහි කර සිටිමු. කෘතියෙහි සෝදුපත් බැලීමේදී මහත් කැපවීමෙන් උපකාරී වූ අප අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම, සහකාර කථිකාචාර්ය විතාරන්දෙණියේ චන්දසිරි යන හිමිපාණන් වහන්සේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දුනේෂ් ඉන්ද්‍රරත්න ගුණතිලක මහතා යන ඇඳුරුවරුන් ද කෘතඥතා පෙරටු ව සිහි කරමු. කෘතියෙහි සෝදුපත් බැලීමේදී සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ පවිත්‍රා මුතුමාලි හා රජිත් මධුසංක යන සහකාර කථිකාචාර්යවරුන් දෙදෙනාගේ අපමණ කැපවීමට අපගේ විශේෂ කෘතඥතාවය පුද කර සිටිමු.

ග්‍රන්ථය මුද්‍රණය කොට ප්‍රකාශනය කරගැනීම ගැටලුවක් ව පැවතියදී ගොඩගේ පොත් මැදුර හා අප සම්බන්ධ කළ අප හිතවත්, සත්පුරුෂ ගති ඇති, මාධ්‍යවේදී දෙනගම සිරිවර්ධනයන්ගේ උපකාරයට බෙහෙවින් ස්තුතිවන්ත වෙමු. අප මාගධිය ඉදිරිපත් කළ මොහොතෙහි ම නො පැකිළ ව එය භාර ගත් දේශබන්ධු සිරි සුමන ගොඩගේ මැතිඳුන්ට ද සෙත් පතමු. එතුමන් මේ සඳහා ඉදිරිපත් නො වන්නට මාගධිය පළ කරගැනීම අපට සිහිනයක් ම වනු ඇත. අවසාන වශයෙන් මෙම භාරදූර කාර්යය සඳහා උපකාරී වූ අප පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදයේ සභාපති, ලේකම් හිමිවරු ප්‍රධාන සියලු නිලධාරී මණ්ඩලය ද සෙහෙසින්



CS Scanned with CamScanner
CamScanner

සිහිපත් කරමු. මේ මාගධී සද් ව්‍යාපාරය තවත් චිර කලක් යෙහෙන් පවතිවා !

**සංස්කාරකවරු**
**පාලි හා බෞද්ධ අධ්‍යයන සංසදය,**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**නුගේගොඩ.**
**2014. 01. 09.**



# ලේඛනාවලී - ලේඛකාවලී


▲ මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය
නාහිමිපාණන්ගේ අනුපමේය ශාස්ත්‍රීය මෙහෙවර xxvii
හසන්ත වාසනා සමරසිංහ
(සංස්කාරක, මාගධී ශාස්ත්‍රීය සඞ්ග්‍රහය)

▲ **Katipayaṭṭhānāni Amhehi Sallakkhetabbāni xxxv**
**Baṭatthalagāmajo Ānandametteyyatthero**

## පාලි භාෂාව හා සාහිත්‍යය

1. පාලිභාසාය වොහාරලක්ඛණානි 1
ආයස්මා මකුරුප්පෙ ධම්මානන්දත්‍ථේරො
(මහාචරියො, පාලිසොගතජ්ඣාපනංසො,
කල්‍යාණිවිස්සවිජ්ජාලයො)

2. උදාන පාළියේ සාහිත්‍යාත්මක වටිනාකම 11
ආචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

3. श्री लङ्काद्वीपे मागधीभाषोन्नतिसाधने महाचार्यस्य
पोल्वत्ते श्री बुद्धदत्तयतीन्द्रवरस्य भूमिका 22
(पेरादेणिय निखिलविद्यालस्य सम्भाव्यभाषाविभागे अचिरस्थायी
उपन्यासकेन वेलिपिटिये इन्दानन्दनामभिक्षुणा लिखितमिदम् ।)

4. විසිවන සියවසෙහි පාලි සාහිත්‍යයෙහි වර්ධනය සඳහා
බලපෑ සම්භාව්‍ය විද්‍යාස්ථානයන්හි ක්‍රියාකාරීත්වය 28
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති,
දුනේෂ් ඉන්ද්‍රරත්න ගුණතිලක
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)




Scanned with CamScanner
CamScanner

5. **Tepiṭaka ajjhayana visaye ke nayā samāropetabbā** 36
Āyasmā Medagampiṭiye Vijitadhammo Bhikkhu (Ph.D)
(Jeṭṭhakathikācariyo, Pāli Sogata Ajjhayanaṃso, Siri Jayavaḍḍanapura Vissavijjālayo)

6. අභිලේඛන කෙරෙහි පාලි බලපෑම 54
සහකාර කථිකාචාර්ය රජිත් මධුසංක
(සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

7. **Suttantāgataatthasaṅkappaṃ saha Aṭṭhakathāsaṅkappaṃ** 66
**Hasantha Wasana Samarasingha**
**(Gāravaupādhiapekkhako, Pali Sogata Ajjhayanaṃso, Siri Jayavaḍḍhanapura Vissavijjālayo)**

8. වජිරබුද්ධි ටීකාව පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් 78
සූරියවැව සුමේධ හිමි
(පාලි විශේෂවේදී - සිව්වන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## බෞද්ධ උපදේශනය

9. නිවන් දකින්නත් හරි උපදේශනයක් ඕනෑ 87
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආරියපාල පෙරේරා
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

10. බෞද්ධ උපදේශනයේ දී උපමාලංකාර භාවිතය 93
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වෑගම පියරතන හිමි
(පාලි අධ්‍යයනාංශ ප්‍රධාන, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, ආචාර්ය, විද්‍යෝදය මහ පිරිවෙණ, මරදාන)



11. බොද්ධ මනෝ උපදේශන ක්‍රමවේදයේ පවත්නා සුවිශේෂී බව පිළිබඳ අධ්‍යයනයක් 107
සහකාර කථිකාචාර්ය එම්. ඩබ්. ඩී. හර්ෂණී
(පාලි හා බොද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## බෞද්ධ මනෝ විද්‍යාව

12. මනස පිළිබඳ බුදුසමයේ එන විග්‍රහයන්, මනෝගති හා මානසික සංවර්ධනය උදෙසා නිර්දේශ 117
ශාස්ත්‍රපති කහගල සාරානන්ද හිමි
(සංඝාරාම පාලක, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, අනුශාසක, සදහම් මැදුර, කොස්ගොඩ)

13. මනෝ ව්‍යාධි කාරක ධර්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම 124
සහකාර කථිකාචාර්ය මැටිබැඹියේ ධම්මසිරි හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

14. බෞද්ධ මනෝ චිකිත්සක ක්‍රමයක් වශයෙන් පිරිත් දේශනාවේ වැදගත්කම 137
ආචාර්ය මොරගොල්ලාගම උපරතන හිමි
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය)

## දර්ශනය

15. ස්වච්ඡන්දතාව හා නියතිවාදය පිළිබඳ විමර්ශනයක් 163
සහකාර කථිකාචාර්ය, ශාස්ත්‍රපති නෙල්ලිවල මෙත්තානන්ද හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

15. දර්ශනය හා එහි කාර්යභාරය පිළිබඳ හැඳින්වීමක් 169
ආලෝකා රශ්මි ලියනගේ
(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)



Scanned with CamScanner
CamScanner

16. බුදු සිරුරේ අතුල් හා පතුල්වල මඟුල් ලකුණු 174
සම්මානිත මහාචාර්ය චන්‍ද්‍රා වික්‍රමගමගේ
(හිටපු මානව ශාස්ත්‍ර පීඨාධිපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

17. කොන්ෆියුසියස් දහම 181
මහාචාර්ය නායිම්බල ධම්මදස්සි හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

18. බුද්ධෝත්පත්තිය සිදු වූ ලුම්බිණියේ ඓතිහාසිකත්වය පිළිබඳ විමසුමක් 193
ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අංශ ප්‍රධාන, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

19. **Introduction to Buddhist Culture in Ancient Sumatra** 206
**Ven. Dr. Beligalle Dhammajoti**
**(Senior Lecturer, Dept. of Pali and Buddhist Studies, University of Ruhuna)**

20. ජපානයෙහි බෞද්ධ සම්ප්‍රදායයෝ (නාරා යුගය) 214
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශාස්ත්‍රපති කේ. ඒ. වීරසේන
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

21. **Buddhist Civilization In Thailand** **222**
Senior Lecturer G.A. Gamini Rathna sri (M. Phil.)
(Dept. of Pali and Buddhist Studies, University of Sri Jayewardenepura)





22. මාංස අනුභවය පිළිබඳ ථෙරවාද මත විමසුමක් 232
සහකාර කථිකාචාර්ය, ආචාර්ය
විතාරන්දෙණියේ චන්දසිරි හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

23. **Buddhist Textual Analysis to Human Resource Management** 249
Ven. Prof. Dr. Gallelle Sumanasiri
(Head, Dept. of Religious Studies and Comparative Philosophy, Buddhist and Pali University of Sri Lanka)

24. පුද්ගල අභිවෘද්ධියට යහපාලනයක අවශ්‍යතාව 262
කථිකාචාර්ය, දර්ශනපති
කුඩාකත්නෝරුවේ විනීත හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

25. සූත්‍ර පිටකාගත සාමය පිළිබඳ අදහස් කිහිපයක් 270
බාහිර කථිකාචාර්ය, ශාස්ත්‍රපති දියගම නාරද හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ආචාර්ය, සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ, නුගේගොඩ)

26. ථෙරවාද බෞද්ධ පිරිතෙහි දක්නට ලැබෙන ධාරණී ලක්ෂණ 296
සහකාර කථිකාචාර්ය, ශාස්ත්‍රපති
සංඛපාලේ පඤ්ඤාසාර හිමි
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

27. නූතන සමාජ ගැටලු විසඳීමෙහිලා බුදු දහමෙහි උපයෝගීතාව 310
සහකාර කථිකාචාර්ය නිරෝෂි ගුණරත්න
(පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)




Scanned with CamScanner

CamScanner

## සාහිත්‍ය විචාරය

28. විචාර බුද්ධිය අවදි කිරීමට මග පෙන්වන සිංහල මිලින්ද ප්‍රශ්නය 320
සහකාර කථිකාචාර්ය එන්. එම්. පවිත්‍රා මුතුමාලි
(සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

29. විරාගයට මග හෙළිකරන භර්තෘහරිගේ වෛරාග්‍යශතකය 331
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, දර්ශනපති
මීපිටියේ සීලරතන හිමි
(භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

30. විශාඛදත්තගේ මුද්‍රාරාක්ෂසයෙහි අනන්‍යතා ලක්ෂණ 354
සහකාර කථිකාචාර්ය පනාමුරේ සුගතසිරි හිමි
(භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## පුරාවිද්‍යාව

31. නිමි ජාතකය සහ කරගම්පිටිය සුබෝධාරාමයේ බිතුසිතුවම් 365
ආචාර්ය ජ්. එම්. එන්. වසන්ත මෙන්ඩිස්
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

32. ලක්දිව ස්තූප සඳහා යොදාගත් ඡත්‍රය 378
සහකාර කථිකාචාර්ය ඉනෝජ් කෞශල්‍ය අබේනායක
(ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර
විශ්වවිද්‍යාලය)



## දේශීය චිකිත්සාව

33. සාහිත්‍යය මූලාශ්‍රය ඇසුරින් හෙළිවන දේශීය චිකිත්සාවේ ඓතිහාසික පසුබිම 387
සහකාර කථිකාචාර්ය උදය නෙලුම් රත්නායක
(ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## කලා හා වෙනත්

34. සිනමා ප්‍රේක්ෂකත්වය හා මනෝවිශ්ලේෂණවාදය 402
සහකාර කථිකාචාර්ය දිල්හානි විජේරත්න
(සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

35. **The History and the Evolution of Greek Drama** 409
Lecturer Sepali Bamunusinghe
(Faculty of Management Studies and Commerce,
University of Sri Jayewardenepura)

36. **The responsibility of Heathcliff's social position for the misery in 'Wuthering Heights' and the importance bestowed to social class and class ambiguity in it** 425
Assistant Lecturer Kaumadee Bamunusinghe
(Department of Linguistics, University of Kelaniya)



Scanned with CamScanner

CamScanner

# මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමිපාණෝ

හසන්ත වාසනා සමරසිංහ

බහුස්සුතා ධම්මධරා අරියා ධම්මජීවිනො
එකග්ගචිත්තා සතිමන්තො තෙන මෙ සමණා පියා.
*(රොහිණීථෙරීගාථා)*

බුද්ධ ශ්‍රාවක ශ්‍රමණයන් බහුශ්‍රැත බැවින් ද, ධර්මධර බැවින් ද, ආර්ය වූ දැහැමි දිවි ඇති බැවින් ද, එකග වූ සිත් ඇති ව ස්මෘතිමත් ව වෙසෙන බැවින් ද රෝහිණියට උන්වහන්සේ ප්‍රිය වූ බව උක්ත ථේරී ගාථාවෙන් කියැවේ. අප මාගධී ශාස්ත්‍රිය සඞ්ග්‍රහය විසින් සුපූජිත විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි සේවාර්ජිත උපකුලපති හා එහි ම මහායාන බුද්ධධර්මාංශයෙහි පීඨාධිපති හා ප්‍රමුඛාචාර්‍ය වූ මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමිපාණන් වහන්සේ ද උක්ත බුද්ධ ශ්‍රාවක ශ්‍රමණ පිරිසෙහි ම මැනැවින් ඇතුළත් කළ හැකි ය. ඒ සියලු සඞ්ඝ ශෝභන ගති ඔබගෙන් විද්‍යමාන වූ බැවිනි.

මාගධී ශාස්ත්‍රිය සඞ්ග්‍රහය විසින් ඔබ සැමරීමේ දී මුලින් ම සිහිපත් කළ යුත්තක් ද වේ. එනම් ඔබගෙන් විද්‍යෝදය (ශ්‍රී ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලයීය පාලි හා බෞද්ධ අධ්‍යයන විෂය ක්ෂේත්‍රයට සිදු වූ අනුපමේය සේවය යි. 1963 වසරේ දී විද්‍යෝදය විශ්වවිද්‍යාලයීය පාලි ශිෂ්‍ය සංගමය විසින් අරඹන ලද අප මාගධී සඞ්ග්‍රහයට පළමු ලිපියෙන් ම සහයෝගය දැක්වූවෝ උන්වහන්සේ ම වෙති. එමතුදු නො ව එම මඞ්ගල කලාපයෙහි සෝදු පත් පරීක්‍ෂා කළෝ ද උන්වහන්සේ ම ය.





Scanned with CamScanner

CamScanner

අප මහැදුරු නාහිමියෝ 1896 වසරේ අගෝස්තු මස 24 වන දින බළන්ගොඩ කිරිදිගල ග්‍රාමයේ උපත ලැබූහ. අනාදිමත් සසර පටන් උපචිත පුණ්‍ය සම්භාර ඇති එතුමා වයස අවුරුදු දහ හතරේ දී දෙණිහේනේ සීලානන්ද හිමිපාණන්ගේ උපාධ්‍යායත්වයෙන් බළන්ගොඩ උඩුමුල්ලේ ශ්‍රී නන්දාරාමයේ දී පැවිදි බිමට ඇතුළත් විය. පැවිදි වීමෙන් පසු වැඩි කාලයක් අධ්‍යාපනයට ම යොමු විය. එදා උන්වහන්සේ කිසිදු පිරිවෙණකට හෝ විශ්වවිද්‍යාලයකට නො වැඩ පන්සලේ ගුරු හිමියන්ගෙන් ම ලැබූ අධ්‍යාපනය පසු කලෙක පැවැති සවැනි මහා ධර්ම සඞ්ගායනාවේ මූලසුන හොබවන මහ තෙර නමක බිහි කරන්නට තරම් ද විද්‍යෝදය විශ්වවිද්‍යාලය වැනි ලෝක ප්‍රකට මහා විශ්වවිද්‍යාලයක මහාචාර්යවරයෙකු හා උපකුලපතිවරයෙකු නිර්මාණය කරන්නට ද තරම් ප්‍රබල වූවක් විය.

අප මහ නාහිමියන් ප්‍රථමයෙන් ම උගත්තේ පාලි භාෂාව යි. ඒ අනුව බාලාවතාරය, නාමපදමාලාව, රූපමාලාව වැනි පොත් පාඩම් කෙරිණි. මුලින් ම එම පොත්වලට විස්තර අර්ථ කියැවීමකින් තොර ව පදවලට පමණක් අර්ථ කියැවීම සිදු විය. අනතුරු ව ධම්මපදට්ඨකථාව පේළි කිහිපයක් කියවමින් ඒ සෑම වචනයක ම පාහේ විභක්ත්‍යන්ත පද, ආඛ්‍යාත පද ආදිය ද තෝරමින් අධ්‍යයනය සිදු විය. මෙලෙස ධම්මපදට්ඨකථාවේ ප්‍රථම වර්ගය කියවා අවසන් වන විට පාලි භාෂාව මැනැවින් කටට හුරු වී තිබුණි. පසු ව කෙමෙන් කෙමෙන් බාලාවතාරය ලියන සන්නයේ ක්‍රමය, ධාතුමඤ්ජුසාව ආදි පොත් ද කියැවිණි. ධාතුමඤ්ජුසාව ඉගැනීමේදී කට පාඩම් දී අර්ථ කියැවීම, සෑම ධාතුවකින් ම තැනිය හැකි පද සෑදීම, ආඛ්‍යාත පද, කෘදන්ත පද සාදමින් වාක්‍ය තැනීම යන ධාතුමඤ්ජුසාවට සම්බන්ධ කර ගත හැකි බොහෝ අංග කෙරෙහි අවධානය යොමු විය.

අප නාහිමියන්ගේ ගුරු හිමියන් මීළඟට සිය ශිෂ්‍යයාට ඉගැන්වීමට යොදා ගත්තේ මිලින්ද ප්‍රශ්නය යි. ඒ වන විට එම කෘතියෙහි පිටු අසූවක් මුද්‍රිත ව තුබූ බැවින් එය කියවමින් එහි විශේෂ පද හමු වූ විට ධාතුව හා ප්‍රත්‍යය විමසමින්, ඇතැම් විට



එහි සූත්‍රය ද විමසමින් ඒ සම්පූර්ණ මුද්‍රිත පොත ම කියවා අවසන් කෙරිණි. ඉන් පසු ව අඞ්ගුත්තරනිකාය තික නිපාතය දක්වා ද යථෝක්තාකාරයෙන් ම ඉගැන්විණි. ඉක්බිති ගාථා බන්ධනය කෙරෙහි අවධානය යොමු වූයෙන් දිනකට එක් ගාථාව බැගින් තෙලකටාහගාථා කෘතිය ෂඩ්විධ වර්ණනාවත් සමඟ ඉගැන්විණි. වයස අවුරුදු දහ අට වන විට ගාථා රචනාව හොඳින් පුරුදු වූයෙන් දිනකට එක් ගාථාව බැගින් තනා ගුරු හිමියන්ට පෙන්වන්නට විය. මේ අතර වුත්තොදය ද සඞ්ක්ෂිප්ත ව උගත්හ. විනය පොත් ටිකකට ද අර්ථ කීමෙන් පසු ව සිදත් සඟරාවට පාලියෙන් අර්ථ කීම නියම විය. මේ ආකාරයට පාලි පරිවර්තන හා නීති රීති සියල්ල මැනැවින් ප්‍රගුණ කර ගත්හ.

පාලි පොත් වලට අමතර ව සිංහල දැනුම වැඩි දියුණු කර ගැනීමට ගංගාරෝහණ වර්ණනාව, ප්‍රාතිහාර්ය ශතකය, මුවදෙව්දාවත වැනි කෘති ද කියවන්නට විය. මේ සියල්ල කියැවූ පසු අවසානයට ගුරු හිමියෝ අශ්වඝෝෂ බුද්ධචරිතය ශිෂ්‍ය හිමි නම අත තැබූහ. සංස්කෘත පොතක් හැටියට මුලින් ම ලැබුණු පොත එය විය. අනතුරු ව සංස්කෘත පොත් කිහිපයක් කියවන්නට විය. එහෙත් අප නාහිමියන් ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු නො කළහ. අප මහ නාහිමියන් තුළ වූ අනුපමේය ශාස්ත්‍රීය රුචිකත්වය කෙතරම් ද යත් උන්වහන්සේ අධ්‍යාපනය ලැබූ මේ වසර නවයෙහි ම රාත්‍රියෙහි සැතපී ඇත්තේ පැය දෙක හමාරක් තරම් සුළු කාල සීමාවකි.

ගුරු හිමියෝ සිය ශිෂ්‍ය නම වයස අවුරුදු විසි හතරක් වන විට ඉංග්‍රීසි දැනුම දියුණු කර ගැනීමට ආනන්ද කොලිජියට එවීමට කටයුතු කළහ. මේ වන විට අනඳමෙත් හිමියන්ට බොහෝ පොත් කඩ පාඩම් ව තිබුණි. එනම් මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි, පාලි නිඝණ්ඩුව, ධාතුමඤ්ජුසාව ආදි පොත් රැසක් සම්පූර්ණයෙන් ම ද පාරාජිකපාළි, පාචිත්තියපාළි, සාරත්ථදීපනී ටීකාව යන පොත් වලින් බොහොමයක් කොටස් වශයෙන් ද යනුවෙනි.

කොළඹ ආනන්දයේ වසර දෙකක කාලයක් ඉංග්‍රීසි ඉගැනීමෙන් පසු ව එහි පාලි ඉගැන්වීමේ පන්ති ආරම්භ විය.



Scanned with CamScanner

CamScanner

මේ සඳහා පොල්වත්තේ බුද්ධදත්ත, කිරුළපනේ විමල ආදි කිහිප නමක් බඳවා ගත් අතර ටික කලකට පසු ව ආනන්ද මෛත්‍රෙය හිමියන් ද එයට බඳවා ගැනිණි. පසු ව ආනන්දයේ ආරම්භ වූ සංස්කෘත ඉගැන්වීමේ කටයුත්ත භාර වූයේ ආනන්ද මෛත්‍රෙය හිමියන්ට ය. මේ ආකාරයට එතුමෝ ආනන්දයේ වසර දොළහක පමණ කාලයක් ඉගැන්වීමේ කටයුතුවල නිරත වූහ. 1935 දී ආනන්දයෙන් ඉවත් වූ නාහිමියෝ බළන්ගොඩ තුඹගොඩ ශ්‍රී සුධර්මාරාමයේ දී ශ්‍රී ධර්මානන්ද පිරිවෙණ ආරම්භ කළහ.

අප නාහිමියන්ගෙන් සිදු වූ ශාස්ත්‍රීය සේවයෙහි උත්කෘෂ්ඨ වූ කටයුතු දෙකකි. එනම් උන්වහන්සේ බුරුමයේ පැවැති ඡට්ඨ මහා ධර්ම සඞ්ගීතියට සඞ්ගීතිකාරකයන් වහන්සේ නමක් වශයෙන් සහභාගී වීම හා විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියා කිරීම ය. 1954-56 වර්ෂයන්හි බුරුමයේ පැවැති සඞ්ගායනාව ථේරවාදී ශාසන ඉතිහාසයෙහි වූ සය වන ධර්ම සඞ්ගායනාව යි. මෙහි සඞ්ගායනා කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට හා මග පෙන්වීමට ''ඕවාදාචරිය මණ්ඩල'' නමින් මණ්ඩලයක් පත් කරන ලදි. 1953 දෙසැම්බර් මස පත් කරන ලද මෙම මණ්ඩලයට නොයෙක් රටවල මහ තෙරවරු සහභාගී වූහ. මේ සඳහා ලංකාවෙන් පරවාහැර වජිරඤාණ, වැලිවිටියේ සෝරත, බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ආදි තෙරවරු සහභාගී වූහ. සඞ්ගායනාවේ පළමු වාරය ආසන්න වන විට ඉන්දියාව, ලංකාව වැනි රටවල විශේෂ පුද්ගලයන් ඉංග්‍රීසි භාෂාවෙන් විශේෂ පණිවිඩ එවා තිබුණි. ඒ සියල්ල ම පාලි භාෂාවට පරිවර්තනය කොට බුරුම අකුරින් ලිවීමේ කාර්යය ද පැවරුණේ අප නාහිමියන්ට ය. තව ද සඞ්ගායනාවේ ත්‍රිපිටක ශෝධක මණ්ඩලයේ කටයුතු සඳහා ලැබුණු ආරාධනා අනුව ලංකාවෙන් පරවාහැර වජිරඤාණ, වැලිවිටියේ සෝරත, මිරිස්සේ ගුණසිරි, බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය යන සතර දෙනා වහන්සේ සහභාගී වූහ.

තව ද සඞ්ගායනාවෙහි මූල, සංසන්දන, ප්‍රතිවිශෝධන වශයෙන් සංශෝධිත පිටක ග්‍රන්ථයන්හිත් ශුද්ධි පත්‍ර කියවා සියලු අඩුපාඩු සකස් කිරීමට ඕසාන ශෝධන මණ්ඩලයක් පත් කොට



තිබුණි. එම මණ්ඩලය විසින් කරනු ලබන කාර්යයන්හිත් අඩුවක් තිබේදැයි පිරික්සනුයේ පස් නමකගෙන් සමන්විත උත්තරීතර ශෝධ්‍ය පත්‍ර පාඨක මණ්ඩලය මගිනි. මෙම මණ්ඩලයට මුලින් ම පත් කර ගත් ලාංකික භික්ෂුව වූයේ පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන් ය. ඉන් අනතුරු ව අප බළන්ගොඩ නාහිමි, තුඩාවේ අරියවංශ නාහිමි ආදීහු එම තනතුරට පත් වූහ. එහි ද අප නාහිමියෝ මාස දහයක කාලයක් කටයුතු කළහ. අප මහ නාහිමියන්ගේ උපචිත පුණ්‍ය සම්භාරය හා ඥාණ සම්භාරය කෙතරම් ද යත් එතුමෝ මේ මහා සඞ්ගායනාවෙහි සභාපති ධූරය ද සති කිහිපයකට දැරීමට තරම් භාග්‍යවන්ත වූහ.

ආනන්ද මෛත්‍රෙය නාහිමියන්ගේ දෙවෙනි මහා ශාස්ත්‍රීය මෙහෙවර වශයෙන් අප විසින් හඳුනා ගනු ලැබුණේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයට සිදු කළ සේවය යි. 1959 වසරේදී ආරම්භ කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි ආරම්භක අධ්‍යයන පීඨ පහක් විය. ඒවා නම් බෞද්ධ අධ්‍යයන පීඨය, සමය හෙවත් දර්ශන පීඨය, භාෂා පීඨය, කලා පීඨය, ආයුර්වේද හා විද්‍යා පීඨය යන ඒවා ය. මෙම පීඨ පහෙන් බෞද්ධ අධ්‍යයන පීඨයට අප මහ නාහිමියන්ගෙන් විශේෂ දායකත්වයක් ලැබුණි.

විශ්වවිද්‍යාලය ආරම්භයේ දී ම වැලිවිටියේ සෝරත නාහිමියන්ගෙන් ලැබුණු ආරාධනාවට අනුව උන්වහන්සේ 1959 වසරේ මාර්තු 01 වන දින මහායාන බෞද්ධ අධ්‍යයනාංශයේ පළමු මහාචාර්ය පදවියේ කටයුතු භාර ගත්හ. ටික කලකින් එම තනතුරෙන් ඉවත් වීමට සිතා සිටිය ද ශිෂ්‍යයන් ඇතැම් ධර්ම කරුණු සම්බන්ධයෙන් වැරැදි අවබෝධ ලබන බව වැටහී ගියෙන් තවත් කලක් එම තනතුරෙහි ම වැඩ සිටිමින් එම දුර්මත විදාරණය කරමින් ශාස්ත්‍ර ප්‍රදානයෙහි නිරත වූහ. මෙසේ කලක් මහායාන බෞද්ධ අධ්‍යයනාංශයෙහි ප්‍රමුඛාචාර්ය ධූරය දැරූ අප නාහිමියන් 1963 නොවැම්බර් 11 වන දින බුද්ධ ධර්මය පීඨයේ පීඨාධිපති බවට පත් කරනු ලැබී ය. මේ ආකාරයට එතුමෝ එම පීඨයට සම්බන්ධ ව වසර දහයක කාලයක් සේවය කළහ.



Scanned with CamScanner
CamScanner

මේ කාල සීමාවේ දී එනම් 1963 ජූලි 17 වන දින විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි ප්‍රථම උපකුලපතිවරයා වූ වැලිවිටියේ සෝරත නාහිමියෝ අපවත් වූහ. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු උපකුලපති ධුරය පලන්නෝරුවේ විමලධම්ම නාහිමියන්ට පැවරුණි. එතුමන් ද වැඩි කලක් එම ධුරයෙහි නො සිට 1966 මාර්තු 07 වන දින අපවත් වූයෙන් හිස් වූ උපකුලපති ධුරය එම මාසයේ ම 12 වන දින පරවාහැර වජිරඤාණ නාහිමියන්ට පැවරුණි.

මේ වන විට ආනන්ද මෛත්‍රෙය නාහිමියන් සිය මහාචාර්ය ධුරයෙන් ඉවත් වීමට උත්සාහ කරමින් සිට ඇත. මේ වන විට කුමන හෝ හේතුවක් නිසා එවකට උපකුලපති ධුරය දැරූ වජිරඤාණ හිමියන් එම තනතුරෙන් ඉවත් වී තිබුණි. එබැවින් රජය එම තනතුර ආනන්ද මෛත්‍රෙය හිමියන්ට පවරා ඇත. ඒ 1966 සැප්තැම්බර් 26 වන දින ය. නාහිමියෝ එම වසරෙහි ම ඔක්තෝබර් 01 වන දින වැඩ බලන උපකුලපති ධුරයෙහි කටයුතු භාර ගත්හ. නාහිමියන් එම තනතුරෙහි සති දෙකක පමණ කාලයක් රැඳී සිටි අතර එය සිය භාවනා, පොත් කියැවීම් ආදි කටයුතුවලට බාධාවක් බව වැටහී ගියෙන් ද අකැමැති කටයුත්තකට සිය අත්සන යොදන්නට වූයෙන් ද උපකුලපති ධුරයෙන් ඉල්ලා අස් වූහ. ඉන් අනතුරු ව එම තනතුරෙහි වැඩ භාර ගත්තේ වල්පොල රාහුල හිමියන් ය.

අප නාහිමියන්ගේ ශාස්ත්‍ර ප්‍රදානය ලබන්නට භාග්‍යවත් වූයේ විද්‍යෝදය විශ්වවිද්‍යාලය පමණක් නො වේ. ලන්ඩන්, කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ්, ලැන්කැස්ටර් යනාදි විශ්වවිද්‍යාලය රැසකට වැඩම කොට දේශන පැවැත්වීම, සාකච්ඡා කිරීම් ආදිය සිදු විය. තවද හාවඩ්, ජෝර්ජ් ටවුන්, වොෂිංටන් වැනි තවත් විශ්වවිද්‍යාල රැසක විද්වතුන් පැමිණ කරුණු දැන ගැනීම නිසා එතුමන් සතු වූ දැනුම බටහිර සරසවි වලට ද විහිද ගියේ ය.

බළන්ගොඩ මහ නාහිමියන්ගේ අනුපමේය ශාස්ත්‍ර ප්‍රදානය ප්‍රකට කරවන තවත් අංශයක් වන්නේ එතුමන් විසින්



රචිත මහා ග්‍රන්ථ සම්භාරය යි. එතුමන් ග්‍රන්ථ කරණයට පිවිසියේ වයස අවුරුදු විසි පහ පමණ දී ය. එතැන් පටන් ලියූ කෘති අතර බුද්ධිවාණී, සංක්ෂිප්ත උදානය, ශාක්‍යසිංහාවදාන බුද්ධ චරිතය, දීඝනිකාය පරිවර්තනය (මෙය කාණ්ඩ තුනක් යටතේ බුද්ධ ජයන්ති මුද්‍රණයෙන් හා හේවාවිතාරණ මුද්‍රණයෙන් ප්‍රකාශිත ය.), සංක්ෂිප්ත දික්සඟිය, සංයුත්තනිකායේ සගාථවග්ග ව්‍යාඛ්‍යානය, ඛුද්දකපාඨ හා ධම්මපද ව්‍යාඛ්‍යාන, පට්ඨාන සංස්කරණය, පාලි මිලින්දපඤ්හ සංස්කරණය, පාලි ශික්ෂකය, පාලි ශික්ෂක ප්‍රවේශය, පාලි නාමාඛ්‍යාත පදමාලා, සංස්කෘතාවතරණිකා, සංස්කෘත ශික්ෂකය, සංස්කෘත බාලාදර්ශ පාඨමාලා, සංස්කෘත භාෂාවතරණය, සංස්කෘත ප්‍රථමාදර්ශ පදමාලා, භදන්ත අශ්වඝෝෂ බුද්ධ චරිත ව්‍යාඛ්‍යානය, ජාතකමාලා සංස්කරණය, ජාතකමාලා ව්‍යාඛ්‍යානය (අමුද්‍රිත යි), සතර පරමාර්ථය, බුද්ධ ධර්මය, ශිශුබෝධ බුද්ධධම්, සිංහල හෝඩිය, නම්පොත, මගුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවි පොත, හිතෝපදේශය, සකස්කඩ, බුද්ධගද්‍යය, සූර්ය ශතකය, බෞද්ධ ශතකය, අනුරුද්ධ ශතකය, ප්‍රත්‍ය ශතකය, ව්‍යාසකාරය, ඉංග්ලිශ් ව්‍යාකරණය, ඉංග්ලිශ් ශික්ෂකය, Life of Buddha for Children, Lessons of Abhidhamma in English, Pali made Easy, The Buddha and his way, Four Divine States, Anapanasati යන නොයෙක් භාෂාවන්ට අයත් කෘති වේ.

අප මහැදුරු හිමියෝ ඉහත ග්‍රන්ථවලට අමතර ව ශ්‍රී බුද්ධ රශ්මි පත්‍රය හා ධර්මරශ්මි ධර්ම සංග්‍රහය සංස්කරණය කළහ. තව ද එතුමෝ බුද්ධ ජයන්ති ත්‍රිපිටක සංස්කරණයෙහි ලා පරිවර්තන කාරක සභාව, පරිවර්තන සංස්කාරක මණ්ඩලය, උත්තරීතර සංස්කාරක මණ්ඩලය හා ලංකා බෞද්ධ මණ්ඩලයේ මධ්‍ය විධායක සභාවෙහි කාරක සභා සභාපති ධුරය ද දැරූහ.

අප මහැදුරු නාහිමියන් පාරප්‍රාප්ත ව සිටි විෂයයන් රැසක් පිළිබඳ වර්ගීකරණයක් සමුදු වෙත්තසිංහයෝ ඉදිරිපත් කරති. ඒවා නම් (01) ත්‍රිපිටකය, (02). පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, ග්‍රීක්, ලතින්, ප්‍රංශ, ෂඩ්භාෂා, (03). සකු, මගද, එළු, දෙමළ, කාව්‍ය හා නාටක, (04). ඍග්, යජුර්, සාමන්, අථර්වන් යන චතුර්වේදය,



Scanned with CamScanner

CamScanner

(05). ජ්‍යොතිෂය, (06). මෝහන විද්‍යා, (07). ගුප්ත විද්‍යා, (08). ආයුර්වේද වෛද්‍ය විද්‍යා, (09). මළවුන් පිළිබඳ විද්‍යා, (10). පෙරදිග හා අපරදිග යෝග ක්‍රම, (11). ප්‍රේත විද්‍යා යනුවෙනි.

මේ ආදි වශයෙන් සඳහන් කොට නිමක් දැකිය නො හැකි තරමේ මහා ශාස්ත්‍රීය සේවයක් ඉටු කළ, සීල, සමාධි ආදි අනේක ගුණයන්ගෙන් සුවඳවත් වූ අප මහැදුරු හිමියන් නොයෙක් ගෞරව නාම, උපාධි, තනතුරු ආදියෙන් ද පිදුම් ලදහ. ඒවා අතර ත්‍රිපිටක වාගීස්වරාචාර්ය, ආගම චක්‍රවර්ති, ප්‍රවචන විශාරද, රාජකීය පණ්ඩිත, සාහිත්‍යසූරි (විද්‍යෝදය), සාහිත්‍ය චක්‍රවර්ති (විද්‍යාලඞ්කාර), අග්ගමහා පණ්ඩිත, මහාරට්ඨගුරු (මියන්මාර් රජය), මහාමහෝපාධ්‍යාය, සමස්ත ලංකා අමරපුර මහා සංඝ සභාවේ ප්‍රථම සභාපති ධුරය, සබරගමු ශ්‍රී සද්ධම්මවංශ අමරපුර නිකායේ රාස්සගල පාර්ශ්වයේ මහා නායක යනු ඉන් කිහිපයකි. මේ සියල් තනතුරු, නම්බු නාම ලැබුණේ බලෙන් ඉල්ලා ගෙන යෑමෙන් නො වන අතර අපිස් ගති ඇති එතුමෝ මේවා ප්‍රදර්ශනය නො කළහ. මාගධී සඞ්ග්‍රහය ආරම්භයේ දී එතුමන් සිත්හි යම් මනෝරථයක් වී ද එය පූරණය කිරීම ම අපගේ ද අභිලාෂය වේ. එය ම එතුමන්ට කරන උත්තම ගුරු පූජාව වශයෙන් ද සලකමු. අප මහැදුරු නාහිමි ශ්‍රී නාමය සදා ලෙව්හි පවතිවා !

### ආශ්‍රිත ග්‍රන්ථ


කෝට්ටවත්ත, හේමන්ත, දූරදර්ශී වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිඃ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය කළමනාකරණ අධ්‍යාපනයේ ප්‍රාරම්භකයා, නුගේගොඩ.

ධම්මාලංකාර හිමි, ඉත්තෑපාන, (2011), බුදුබව පතන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි, ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, දෙහිවල.

නන්ද හිමි, ඇකිරියගල, (2010), බෞද්ධ සංස්කෘති ලේඛන, සංස්කරණයඃ පඤ්ඤාරතන හිමි, මහමිතව, ඉලංගකෝන්, සමන්ත, මාගධී පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය, පූවක්පිටිය.

වෙත්තසිංහ, සමුද්‍ර, (2011), ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන්ගේ අප්‍රකට ලිපි, සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන, හොරණ.

වෙත්තසිංහ, සමුද්‍ර, (2012), ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන්ගේ දින සටහන්, සමුද්‍ර වෙත්තසිංහ ප්‍රකාශන, හොරණ.




# Katipayaṭṭhānāni Amhehi Sallakkhetabbāni*

Baṭatthalagāmajo Ānandametteyyatthero

**Suviditaṃ maññe āyasmantānametaṃ yadidaṃ etarahi bhikkhūsu gahaṭṭhānaṃ pasādo hāyati appasādo yeva vaḍḍhatīti. Dissanti cājja ekacce janā ye bhikkhū uppaṇḍhentā vicaranti, sūyate ca tesaṃ ujjhāyantānaṃ khīyantānaṃ vipācentānaṃ 'itipime bhikkhū duppaṭipannā, itipi na ime suppaṭipannā'ti. Evaṃ tesaṃ pavattipattamaggena ca vacīmaggena ca nindāntanaṃ garahantānaṃ uppaṇḍentānaṃ sutvā nāmhehi kujjhitabbaṃ, na vā udāsīnehi appossukkehi bhavitabbaṃ. Api ca vīmaṃsitabbaṃ upaparikkhitabbaṃ 'kiṃ ime bhonto asatā vā abhūtena evaṃ garahanti udāhu satā bhūtenāti. Yuttito mayametaṃ gaṇhāma dhammato yaṃ pasādanīye ṭhāne yeva buddhimanto pasīdanti no appasādanīye, pasādārahaṃ guṇaṃ disvā yeva te pasīdanti no adisvā'ti. Pubbe pana gahaṭṭhā bhikkhū disvā, 'bhabbarūpā vatime samaṇā sakyaputtiyā, susaṃvutindriyā vatime samaṇā sakyaputtiyā, pasannāni vatimesaṃ indriyāni, sobhante vatimesaṃ iriyāpathā'tīccādinā vaṇṇayiṃsu,**

---

* මහාචාර්ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමියන් විසින් රචිත මෙම ලිපිය මාගධී 1963 මංගල කලාපයෙන් උපුටා ගන්නා ලද්දකි. මෙහි මුල් ලිපිය සිංහල අකුරින් මුද්‍රිත ව ඇති අතර මෙවර අකුරුකරණයේ පහසුව පිණිස එය ඉංග්‍රීසි අකුරෙන් යෙදූ බව සැලකුව මනා ය.



Scanned with CamScanner

CamScanner

pasādañca mahantaṃ tesu janayiṃsu. Tiṭṭhantu gahaṭṭhā upāsakā, kintu aññatitthiyā'pi paribbājakā sayaṃ sāsanassa paccatthikā paccāmittāpi samānā'pi buddhasāvakānaṃ susaṃvutindriyatādīni disvā te vaṇṇayiṃsu, yathā taṃ suppiyassa paribbājakassa antevāsī brahmadatto māṇavo yo sakaṃ parisaṃ avaṇṇārahaṃ ca buddhasāvakaparisaṃ vaṇṇārahaṃ ca katvā sakassevācariyassa santike dassesi.

Api ca kathametarahi ? Vihāre'pi antaraghare'pi keci bahutarā asaṃvutindriyā iriyāpathavipaṇṇā carantā dissanti. Sekhiyāsu niddiṭṭhā ye samācāravidāyo, te ajānantā vā jānitvā'pi agaṇayantā maññe keci caranti. Evaṃ sante'pi ajjā'pi tāva lajjino kukkuccakā sikkhākāmā tattha tattha kiñcāpi dissanti api ca te appatarā gihīnamappasādajanakā yeva bahutarā vattanti. Natvetaṃ sāsane pasannānaṃ appasādāya appasannānaṃ vā bhiyyobhāvāya saṃvattati ?

Puna ca paraṃ āyasmanto yassa kassaci rañño vā rājaputtassa vā rājamahāmattassa vā idhāgamanaṃ vā tādisamaññataraṃ vā adhikicca mahājane mahussavādiṃ pavattayante kadā'ci therā'pi bhikkhū dissanti chaṇadassanattaṃ senādassanatthaṃ nagarasirivilokanatthaṃ vā tattha tattha vicarantā saddhiṃ aantevāsīhi'pi yathā taṃ gahaṭṭhā kāmabhogino. Nanvetādisaṃ gihīnamappasādāya saṃvattati ?

Puna ca paraṃ āyasmanto etarahi bhikkhū dissanti bhiyyosomattāya cīvaramaṇḍanādisu anuyuttā parikkhāre agghatare aggatare yeva apekkhantā taṃ



lābhāya ussukkamāpannā, yena vā tena vā upāyena bāle abyatte upāsake ārādhetvā tadatthāya bahuvidhena upāyena vāyamantā, ye yathālābhasantosādayo guṇe guṇato agaṇayantā maññe caranti. Nanvetaṃ gihīnaṃ pasannānaṃ appasādāya appasānampi bhiyyobhāvāya saṃvattati ?

Arisāvakesu'pi tāva kesuci ekaccā paṇṇatti-vajjamattā lahukā āpattiyo kadāci āpajjantesu santesu netaṃ labbhā yaṃ putujjano kamapi āpattiṃ anāpannako vijjatīti. Tato yevamhākaṃ bhagavā buddho sikkhākāmesu bhikkhusu anumampamupādāya āpattivuṭṭhānopāyaṃ nāma dassesi. ñānametaṃ vijjati yaṃ sikkhākāmo'pi bhikkhu yadā kadāci'pi attano potujjaññadosavasena pamādamanvāya kaṃcideva desaṃ āpattiṃ āpajjeyyāti. Tādise pana ṭhāne kukkuccako sikkhākāmo bhikkhu lahukampi āpattiṃ pārājikamiva sallakkhento sikkhāvītikkamabhayabhīto 'nevāhamito paraṃ īdisamācarissāmī'ti āyatisaṃvare attānaṃ patiṭṭhāpeti. Etadatthamevetaṃ yadidaṃ āpattivuṭṭhānopāyo nāma, natveva āpattāpajjanassa bhiyyobhāvatthaṃ.

Edisesu bahusu ṭhānesu paṭisiṃcikkhīyamānesu bahutarānamajja bhikkhūnamācāro sāsanamāmakānaṃ gahaṭṭhapabbajitānaṃ mahato ānutappāya saṃvatte'ti khāyati. Nanvesā dhammatā yaṃ garukesu'pi vajjesu lahukadassāvīsu bhikkhūsu gaṇanāya vaddhantesu te bahutare asikkhākāme disvā gahaṭṭhā ujjhāyantipi khīyantipi vipācentipīti.



Scanned with CamScanner

CamScanner

Iccevaṃ bahutaresu bhikkhusu uppaṇḍanārahe ṭhāne vattantesu netaṃ vimbhayāvahaṃ yaṃ gahaṭṭhā etarahi assaddhā appasannā caranti, bhikkhū'pi garahanti uppaṇḍentīti. Atthi nu kho'dāni atra yaṃ kiñci paṭikammaṃ kattabbaṃ ? atthi yeva, no natthi.

Yajjamhākaṃ mahātherā attano antevāsike patirūpe anucchavike ṭhāne niveseyyuṃ, no hetaṃ bhaveyya yathā etarahi. Yaṃ bhagavatā paññattaṃ, yaṃ ca tadanugacchantehi porāṇakehi mahātherehi āciṇṇaṃ, tadatikkamma paccayagedaṃ pubbaṅgamaṃ katvā taṃ taṃ ācarantānaṃ therānaṃ hetu tesaṃ pacchimāpi jantā diṭṭhānugatiṃ āpannā yathākāmakārinī avinītā jāyateva. Tatridaṃ sallakkhetabbaṃ.

Upasampannena hi bhikkhunā upasampattito paṃcavassāni dhammavinayaṃ pariyāpuṇantena ācariyaṃ nissāyeva vatthabbaṃ. Tato paraṃ tena bahussuteneva nissayaṃ muñcitvā ācariyena vinā'pi viharituṃ labbhati, kintu neva tena sāmaṇero upaṭṭhāpetabbo. Atha so dhammavinayaṃ sammā uggaṇhitvā dasavassiko vā atirekadasavassiko vā jāto parisupaṭṭhāpakabahussuto samāno'va sāmaṇeraṃ upaṭṭhāpetuṃ ācariyo vā upajjhāyo vā bhavituṃ labhati. Dasavassiko'pi samāno pana abahussuto na labhati sāmaṇeraṃ upaṭṭhāpetuṃ ācariyo vā upajjhāyo vā bhavituṃ. Tādisena pana ekaṃ bahussutaṃ theraṃ nissāyeva vatthabbaṃ. Tiṭṭhatu dasavassiko kintu saṭṭhivassiko samāno'pi abahussuto sāmaṇerūpaṭṭhāpanādiṃ na labhati yeva. Tena pana



yāvajīvampi yaṃkañci bahussutaṃ theraṃ nissāya vatthabbaṃ. Ayamettha sāmīci.

Api cetarahi etaṃ sāsanikaṃ mariyādamullaṃghenti bahutarā bhikkhū. Etādisassa atthibhāvampi nassaranti, sarantā'pi na sallakkhenti.

Keci therā yattha vā tattha vā attano niyyādite āvāse sati taṃ rakkhituṃ paraṃ nissāya vasanārahaṃ abahussutampi samānaṃ navakabhikkhuṃ vā sāmaṇeraṃ vā tattha pesenti, mā te upāsakā aññapakkhato vā añña nikāyato vā kañci bhikkhuṃ tatra āneyyunti. so'pi yathāvutto bhikkhu serivārī viharamāno sayaṃ vinaye avinīto samāno pi aññaṃ pabbājeti. So'pi vattapaṭivattādimhi sammā asikkhito kale gacchante ācariyato'pi avinītataro hutvā yathicchitaṃ agocare caramāno anesanamāpanno kulāni dūsento yena vā tena vā upāyena andhabāle gahaṭṭhe ārādhento akappiyavohārena santihitapaccayo niccaṃ uccāvacā āpattiyo āpajjanto alajjī vā abhikkhu yeva vā bhikkhupatirūpako jāto viharati. Nanu ajja keci pabbajitā edisā jātā. ?

Yadi parisuṭṭhāpakabahussutaṃ yeva mahā theraṃ saṅghapituṭṭhāne saṅghaparināyakaṭṭhāne niyojetvā avasiṭṭhā theranavakamajjhimā tamanuvatteyyuṃ, So saṃghapitā'pi chandādivasā agatiṃ agacchanto puggaliya - yasissariyādisu anapekkho attano sabrahmacārino sammā nayeyya navakā'pi paṃcavassikā'pi taduttariyā'pi abahussutā bhikkhū sāmaṇeruṭṭhāpanādiṃ vihāya bahussute yeva nissāya yāvajīvaṃ sammā vatteyyuṃ, nissaṃsayamevetaṃ



Scanned with CamScanner
CamScanner

pāṭikaṅkhaṃ yaṃ nacirassameva bhikkhū pūjārahā vandanārahā aññatitthiyaparibbājakānampi ādessā bhavissantīti.

Uttarimpettha vattabbamatthi yeva.

Ekamidāhaṃ āyasmanto samayaṃ keralesu viharāmi kukkuṭakkoḷe (Calicut) nāmakeralānaṃ nagare navāvasathe sirikaṇhena seṭṭhinā kārite. Tatra sudaṃ ekadā maṃ āvasathapacchāyāyaṃ nisinnamaddasa aññataro caturarūpo puriso kenacideva karaṇīyena samīpamaggena gacchanto. Disvāna 'laṃkiyo bhikkhu maññe'ti vācaṃ nicchāresi. Atha so yenāhaṃ tenupasaṅkami. Upasaṅkamma aññatarasmiṃ āsane nisīdi, nisajja ca pana 'laṅkiyo bhikkhu bhavaṃ maññe'ti dutiyampi vācaṃ nicchāresi. Ahampi 'āmāvuso'ti tassa paṭissutvā 'kathannu tvaṃ maṃ āvuso laṃkiyaṃ bhikkhuṃ saṃjānāsī'ti avacaṃ. So maṃ āha "netaṃ bhavaṃ mayhaṃ dukkaraṃ ciraṃ laṅkāyaṃ vutthapubbassa. Ahaṃ hi bhavaṃ vāṇijjena gato ciraṃ laṅkāyaṃ vāsaṃ kappesiṃ, katipayavassāni marammavisaye cā''ti. Iti vatvā so maṃ pucchi. "Kena nāma bhavaṃ karaṇīyena idhāgato ?''ti. Tamahaṃ paccābhāsiṃ "dhammadūteyyaṃ āvuso karonto idhāgatom'hī''ti. Atha so āha "iccāmahaṃ bhavaṃ tassa buddhassa tumhākaṃ satthuno dhammaṃ kañcideva desaṃ sotunti.'' Tassāhaṃ mettasuttaṃ desesiṃ. So haṭṭhappahaṭṭhākāraṃ dassetvā "yāvamadhuraṃ vatidaṃ bhavaṃ tassa bhagavato bhāsitaṃ yāvahadayaṅgamamidaṃ bhavaṃ tassa satthuno bhāsitanti udānaṃ udānetvā, maṃ



pucchi "kīvaciraṃ bhavaṃ idha vaseyyā''ti. Ahaṃ paccabhāsiṃ "nāhaṃ āvuso ciraṃ idha vasissaṃ, dvinnaṃ vā tiṇṇaṃ sattāhanamaccayena laṃkādīpaṃ paṭinivattissanti.'' Atha so āha "sace bhavaṃ yo koci idha tassa bhagavato sāsane pabbajitumiccheyya, kathaṃ bhavaṃ tasmiṃ paṭipajjeyyā ? ''ti. Ahamavacaṃ "tamahaṃ laṃkādīpaṃ nessāmī''ti. So āha "mā hevaṃ bhavaṃ kareyya aññaṃ bhavaṃ kañci upāyaṃ cinteyyā''ti. Tamahaṃ tahāvādinaṃ pucchiṃ "kathaṃ hevamāvuso vadeyyāsī ?''ti. So avoca "diṭṭhapubbā mayā bhavaṃ laṃkāyaṃ vasanā sīhaliyā bhikkhū sutapubbāni ca tesaṃ katākatāni. Atra bhavatā mayhaṃ dhammaṃ desentena yāni vuttāni bhikkhunā attani nivesetabbāni guṇāni 'sakko uju ca suhujū cā'dinā nayena, tesu antamaso ekenāpi guṇena etarahi bahutarā bhikkhū yadi samannāgatā bhaveyyuṃ etadeva pamāṇanti maññe. Tiṭṭhantu aññe. "Tumhākaṃ saṅghānāyakesu pi kati nāma therā maddavena samannāgatā abbhākuṭikā sukhasambhāsā paṭisanthāravuttino dissanti santussakā subharā ca ? api cāhaṃ sayameva disvā jānāmyetaṃ yaṃ te bahutarā thaddhā bhākuṭikā asantussakā dūbharā cāti. Kintu sāvakā'pi bhavaṃ pabbajitā bahutarā dissanti bhavataṃ saṅghanāyakehi mudutarā sukhasambhāsatarā subharatarā santussakatarā ca. Saramyāhaṃ bhagavatā vuttaṃ 'bhikkhu sallahukavutti assā'ti. Sakkoti nu kho bhavaṃ etarahi bhikkhūsu dassetuṃ antamaso dasasu ekampi yo sallahukavutti vattate? Diṭṭhā yeva mayā bhavaṃ tumhākaṃ vihārārāmā paripuṇṇā gihīsāruppehi mahagghehi



Scanned with CamScanner

CamScanner

bhaṇḍehi yāni niccaparibhogena puggaliyaparibhogena te nevāsikā bhikkhū paribhuñjanti yathā taṃ gihino odātavasanā. Diṭṭhā khalu mayā bhavaṃ te saṅghanetāro divā'pi seyyāsukhena middhasukhena vītināmentā sokhumallavaḍḍhanaparā ālasiyānuyogamanuyuttā. Diṭṭhā ca te mayā parikkhārasannicayaṃ karontā mahagghesu parikkhāresu āsattasaṃsattacittā maññe caranti. Tesaṃ vo bhavaṃ saṅghanetārānaṃ kuto sallahukavutti? Kuto yathālābhasantuṭṭhi? Tesu netāresu'pi evaṃ santesu kimaṅga pana avasiṭṭhā bhikkhū tehi nītā ca nīyamānā ca. Idhapanamhākaṃ bhavaṃ santi eke paribbājakā vedantavādino Rāmakaṇhaparamahaṃsassa nāma sāvakā. Te vata bhonto santi bahū ye B. A. M. A. iccādivasā laddhādhikārapattā, kovidā nānāvidhesu dhammesu satthesu ca. Idha te bhāratavisaye mānitā honti pūjitā rājarājamahāmattehi mahābhogehi tadaññagahaṭṭhehi ca te vata bhonto paribbājakā tumhākaṃ mahānāyakatherehi'pi adhikataraṃ catuppaccayaṃ labhanti, api ca na te parikkhārasannicayaṃ karonti. No ce ettha maṃ bhavaṃ saddaheyya, upasaṃkamatu bhavaṃ yena tesaṃ assamā, sayameva disvā jānātu. Atthatakambalamatte phlake te seyyaṃ kappenti, yathāladdhena yena kenaci bhojanena tussanti, paresaṃ dhammaṃ desentā anāthūpakāraṃ karonto ca etasmiṃ antare'pi cittabhāvanamavijahantā te kālaṃ vītināmenti. Na te saddhādeyyāni bhojanāni bhuñjitvā divāsoppena vā tiracchānakathāya vā viggāhikakathāya vā kālaṃ yāpenti yathā tumhākaṃ bahutarā laṃkiyā mahātherā.



Nanu bhavaṃ tumhākaṃ saṅghapitarehi itaresaṃ bhikkhūnaṃ ādessehi bhavitabbanti?''

Iccevaṃ so maṃ anekapariyāyena vigarahitvā uttarimpi maṃ pucchi ''atthi nu kho bhavaṃ laṃkiyesu bhikkhūsu jhānalābhino vā jhānamaggapaṭipannā vā?''ti. Nāhaṃ kiṃci avavāsiṃ. Punapi so kathento maṃ etadavoca: ''jānāmyāhaṃ etaṃ bhavaṃ yaṃ sīhalesu dullabhā etarahi bhikkhusu jhānalābhino vā jhānamaggapaṭipanno vā'ti. Api ca idha bhavaṃ vedantavādīsu paribbājakesu keci santi jhānalābhino ye kadāci dissanti, jhānamaggapaṭipannā tāva bahū. Santamhākampi bhavaṃ paribbājakānaṃ gaṇanāyakā ye khalu sabbathāpi anugāmīhi guṇavantatarā paññavantatarā ca. Na hi te yathā tumhākaṃ gaṇanāyakā yesu sambahulā attano anucarehi'pi hīnatarā yadidaṃ guṇena ñāṇenāpī''ti.

Evaṃ vuttoha'ṃ tassa vadesiṃ '' nāhaṃ āvuso saddahāmi tesaṃ vo yathāvuttajhānalābhīnaṃ jhānalābhitaṃ. Te'haṃ maññe indajālādimantaparivattakā vijjādharā'ti. Atha so maṃ paṭibāhento āha ''kathannu bhavaṃ maññati sayaṃ ajhānalābhī yeva samāno pare jhānalābhipaṭiññe evaṃ omaññituṃ laghayituṃ vā?''ti. Athāhaṃ tuṇhī ahosiṃ. Uttarimpi so kathento maṃ etadavoca ''anattavādino nanu bhavaṃ laṅkhiyā bhikkū?''ti. ''āmāvuso''ti ahaṃ paccassosiṃ. Atha so āha ''sutapubbametaṃ mayā bhavaṃ yaṃ laṅkiyā bhikkū attānamukkaṃsenti pare ca vambhenti 'mayamamha anattavādino sammādiṭṭhikā pare pana



Scanned with CamScanner

CamScanner

attavādino micchādiṭṭhikā'ti. Yathā vā tathā vā bhavaṃ tesaṃ anattavādo hotu, nāhaṃ bhavaṃ tassa bhagavato gambhīraṃ anattavādamadhikicca vivādamāpajjāmi. Api cettha sampadamidaṃ pucchitabbameva ''ke nāma'dāni tena bhagavatā vaṇṇitehi subharatā - santuṭṭhatā - suvacatā - sallahukavuttitā - muditā - mettā - bhāvanārāmatādīhi guṇehi samannāgatā? Tumhākaṃ anattavādino vā laṅkiyā bhikkhū udāhu amahākaṃ attavādino vedantavādino paribbājakā?'ti. Yathābhūtaṃ bhavaṃ passantehi sammāvadamānehi vattabbametaṃ yaṃ etarahi laṅkiyā bhikkhū bahutarā tehi gunehi hīnatarā vattanti yattha pare attavādino'pi samānā paribbājakā tesu kehicipi guṇehi laṃkiyehi bhikkhūhi guṇavantatarā'va paññāyante'ti. Puna ca paraṃ bhavaṃ tumhākaṃ anattavādipaṭiññesu bhikkhūsu bahutaresu paccayagiddhesu vattantesu amhākaṃ attavādino paribbājakā paccayagedharahitā vattanti. Tumhākaṃ anattavādīsu bhikkhūsu bahutaresu brahmacariyakilissanakaṃ nānāvidhaṃ hīnaṃ gammaṃ carantesu amhākaṃ attavādino paribbājakā mahatā ussāhena suddhaṃ brahmacariyaṃ caranti. Evaṃ sati bhavaṃ ko attho tumhākaṃ anattavāditāya aññatra attukkaṃsanaparavambhanamattāya. Api cāhaṃ bhavaṃ saddahāmi yeva yaṃ tumhākaṃ satthari dharamāne ca tato paraṃ ca dīgharattaṃ te buddhasāvakā sabbathā pi aññatitthiye abhibhuyya virociṃsu yadidaṃ guṇena ñāṇena ca. Atha ca panetarahi laṅkiyā bhikkhū bahutarā guṇañāṇādīhi aññatitthiyehi hīnatarā yeva dissanti aññatitthiyā pana te abhibhuyya ativiya virocanti



maññe. Api ca kho tassa bhagavato dhammavinaye amhākaṃ pasādo balavā''ti. Ata so kālo'dāni bhavaṃ mama gamanāyā''ti vatvā nikkhami.

Dhammatā panesā yaṃ mayaṃ pabbajitā samānā yadi sakaṃ gocaraṃ atikkamma appatirūpe agocare careyyāma, aññatitthiyānampi garahāya evaṃ lakkhā bhavissāmāti. Etāni aññāni ca edisāni ṭhānāni bhikkhūnaṃ asāruppāni appatirūpāni upadhāretvā amhākaṃ therā ca majjhimā ca tathā navakā ca sāsanābhivuddhimapekkhamānā yaṃ yadeva bhikkhūnaṃ ananucchaviyaṃ taṃ pahāya anucchavikameva gaṇhantu patirūpameva ācarantu pure gahaṭṭhā bhikkhūsu appasannā gaṇanāya vaḍḍhitvā paṭiviruddhā uṭṭhahanti, pure te bhikkhūnaṃ vināsāya parisakkanti yathā taṃ rasiyāvisaye kittuladdhikapabbajitānaṃ yāva bahumpi dhammaṃ vā satthaṃ vā pariyāpunantehi sikkhāsamācāravidhi nāma anugantabbo yeva yāva bahuṃ dhammasatthavisayesu nipuṇā bhavanti tāva bahuṃ tehi sovacassatā-nivātavuttitādīhiguṇehi vaḍḍhitabbaṃ. Yaṃ tena bhagavatā vuttaṃ 'apadānasobhinī paññā'ti kālena kālaṃ taṃ anusaritabbaṃ. Ācārasīlato vuddhiyā asantiyā kathamettha tato uttaritarānaṃ jhānādīnamadhigamo pāṭikaṅkho? Etesu asantesu kathaṃ nāma siyā sāsanassa vaḍḍhi? Pākaṭametaṃ yaṃ therā buddhānussatādīni cattāri kammaṭṭhānāni tathā dasadhammasuttādīni antevāsike sikkhāpentīti. Etesaṃ pana dhammānaṃ



Scanned with CamScanner
CamScanner

pariyāpunanamattameva na hettha pamāṇaṃ parantu mahāvijjālayesu ajjhayantehipi sāsanāvacarehi kulaputtehi kālena kālaṃ tāni manasikātabbāni. Sāsanamariyādaṃ ca anatikkamantehi vattitabbaṃ evaṃ vattantānaṃ bhikkhūnaṃ vissavijjālayesu vā aññatra yattha katthaci anurūpe vijjāpīṭhe vā ajjhentānaṃ hetu vaḍḍhi yeva sāsanassa pāṭikaṅkhā no avaḍḍhi.

Gahaṭṭhehi'pi te pāsaṃsiyā bhavanti pūjjā saṃghasobhanāpi te bhavantā sadevakassa lokassa atthāya hitāya saṃvattantīti.



CS Scanned with CamScanner

CS CamScanner